# තනතුරු පුරප්පාඩු

## සීමාසහිත හොරොම්බාව විවිධ සේවා සමූපකාර සමිතිය
## හොරොම්බාව

සීමාසහිත හොරොම්බාව විවිධ සේවා සමූපකාර සමිතියේ පුරප්පාඩුව පවතින CEL – III වැටුප් පරිමාණයේ ප්‍රධාන විධායක නිලධාරි තනතුර සඳහා පහත සුදුසුකම්ලත් සමිති අභ්‍යන්තරයෙන් හා වයඹ පළාත තුළ ස්ථිර පදිංචි අයදුම් කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**තනතුර** : ප්‍රධාන විධායක නිලධාරි

**වයස** : අවුරුදු 18 – 45 (දැනටමත් සමූපකාර සේවයේ නියුතු වූවන් සඳහා මෙය අදාළ නොවේ.)

**වැටුප් පරිමාණය** : CEL – III පංතිය ( 3/2020 චක්‍රලේඛය අනුව )

43500 – 69500 A ශ්‍රේණිය
900 x 10 – 1000 x 11 – 1200 x 5

මීට අමතරව සමිතියෙන් ලබා දෙන සියලුම දීමනා ගෙවනු ලැබේ.

මෙයට අමතරව සේවක අර්ථසාධක අරමුදල සඳහා සහ වයඹ පළාතේ ක්‍රියාත්මක සමූපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට ද, හිමිකම් ලැබෙනු ඇත.

**මූලික සුදුසුකම්**

සිංහල / දෙමළ හා ගණිතය ඇතුළුව විෂයන් 04 කට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයන් 06 කින් අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය සමත් විය යුතුය.

**අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් (අභ්‍යන්තර)**

අ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඕනෑම විෂය ධාරාවක් යටතේ උපාධියක් ලබා තිබීම සමග MEL වැටුප් පරිමාණයේ තනතුරක වසර 05 ක හෝ TSL වැටුප් පරිමාණයේ තනතුරක වසර 08 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

ආ. පිළිගත් ආයතනයකින් ලබා ගත් වසරකට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත ගිණුම්කරණය හෝ ව්‍යාපාර කළමනාකරණය හෝ වෘත්තීය කළමනාකරණය හෝ වාණිජ / ආර්ථික විද්‍යාව විෂය සහිතව හෝ ඩිප්ලෝමාවක් සමත්වීම සමග MEL වැටුප් පරිමාණයේ තනතුරක වසර 05 ක හෝ TSL වැටුප් පරිමාණයේ තනතුරක වසර 08 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් (බාහිර)**

අ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් විද්‍යාවේදී හෝ වාණිජවේදී හෝ ව්‍යාපාර කළමනාකරණය හෝ ආර්ථික විද්‍යාව විෂයය සහිතව හෝ උපාධියක් ලබා තිබීම සමග පිළිගත් ආයතනයක විධායක මට්ටමේ තනතුරක වසර 03 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම

ඉහත සුදුසුකම් අනුව, තමා විසින් පිළියල කරන ලද අයදුම්පත්, අදාල සහතිකවල ඡායා පිටපත් සමග "ගරු සභාපති, සීමාසහිත හොරොම්බාව විවිධ සේවා සමූපකාර සමිතිය – හොරොම්බාව" යන ලිපිනයට 2024.12.13 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, ලිපියේ ඉහළ වම් කෙලවරේ "ප්‍රධාන විධායක නිලධාරි – CEL - III" ලෙස සටහන් කර තිබිය යුතුය.

**මෙයට,**
**සමූපකාරික සභාපති,**
**සී/ස හොරොම්බාව විවිධ සේවා සමූපකාර සමිතිය, හොරොබාව.**
**දුක.අං 037 – 2249403**
**2024.11.25**